කඞ්ඛාවිතරණ විසුද්ධිය
28.09.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

තෙරුවන් සරණයි ශ්‍රද්ධාවන්ත පින්වත්නි, දැන් අපි දහවල් ආහාරපාන අරගෙන ඉවර උනාට පස්සේ පැවැත්වෙන ධර්ම සාකච්ඡාවට තමයි මේ සූදානම්ව සිටින්නේ. ඉතින් අද මේ ධර්ම සාකච්ඡාව තුලින් අපි මේ පින්වතුන්ට ප්‍රායෝගිකව ඉදිරිපත්වෙන සහ ප්‍රායෝගික භාවනා ලෝකයේ ඉදිරිපත්වෙන කරුණු කාරණා කීපයක් කියලා දෙනවා. අද මේ කියා දෙන ධර්ම කරුණු ටික ඉතාමත්ම හොඳින් අහගෙන හොඳට තේරුම් අරගෙන ඒ අනුසාරයෙන් හිත මෙහෙයවලා මනසිකාරය හදාගෙන මේ ස්කන්ධ ලෝකයෙන්, දුක්ඛ ලෝකයෙන් අයින්වෙලා නිවනින් සැනසෙන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

ධර්මයේ තිබෙනවා වචනයක් **කඞ්ඛා** කියලා. ස්ථිරත්වයක් නැති කිසිම විස්වාසයක් ගන්න බැරි සැකය කියන එකට තමයි අපි **කඞ්ඛා** කියලා කියන්නේ. සිංහලෙන් අපි සාංකාව කියලා කියනවා පාළු ගතියට. **කඞ්ඛා** සහ සාංකාව කියන වචන දෙකට එක හා සමාන ශබ්දයක් තිබුණාට **කඞ්ඛා**ව කියලා කියන්නේ **විචිකිච්ඡා** කියන සැකයට. මේ **කඞ්ඛා** කියන සැකය හොඳ එකක් නොවෙයි. මේක අපි තුල තිබිය යුතු නෑ. මේක ධර්මය සම්බන්ධයෙන් හිතේ තිබෙන එක්තරා සැක ස්වභාවයක්. මේ සැකය නිසා අපිට ධර්ම මාර්ගයේ යා ගන්න විදියක් නෑ. ඒක හරි භයානකයි.

අපි මේ භාවනා මාර්ගයේ යනකොට, සීල සමාධි ප්‍රඥා කියන ධර්ම මාර්ගයේ යනකොට අපිට තිබෙන්න ඕනෑ එක දෙයක් තමයි, 'මේ කරන වැඩේ, මේ වඩන දේ මට ප්‍රයෝජනවත් වෙනවද, මේ ධර්ම මාර්ගයේ ගිහිල්ලා මට මිදීමට, නිවනට පත්වෙන්න පුලුවන්ද' කියන ස්ථාවරත්වය. ඒක නැති උනොත් එහෙම යා ගන්න බෑ ඉස්සරහට. සැකය නිසා යන්න බෑ, සද්ධාව පිහිටන්නේ නැතුව යන්න බෑ. ඒක නිසා මේ සැකය කියන එක හරි භයානකයි.

නීවරණ ධර්ම පහක් තිබෙනවා. **කාමච්ඡන්දය - ව්‍යාපාදය - ථීනමිද්ධය - උද්ධච්ච කුක්කුච්ච - විචිකිච්ඡා** කියලා. විචිකිච්ඡා කියලා කියන එක තමයි මේ සැකය කියලා කියන්නේ. මේ සැකය, භාවනා මාර්ගයේ යනකෙනා නැතිකරගන්න ඕනෑ, තුරන් කරගන්න ඕනෑ. සැකය කියන ධර්මය සම්පූර්ණයෙන්ම නැති වෙන්නේ එකතැනකදී, ඒ තමයි සෝවාන් මාර්ගයේදී. සෝවාන් මාර්ග අවස්ථාවට යන්න කලින් තව ගොඩක් වැඩ කරන්න තිබෙනවා. ඒ කරන්න තිබෙන වැඩ ටිකත් සැකයක් නැතුව ඕනෑ කරන්න. නැත්නම් එතැනට යන්න බෑ. ඒක නිසා මේ ධර්ම මාර්ගයේ සැක සංඛා නැති කරනාවූ විචිකිච්ඡා නැති කරන්නාවූ භාවනා වැඩසටහනක් තිබෙනවා, භාවනා මනසිකාරයක් තිබෙනවා. ඒවගේම විදර්ශනා මනසිකාරයක් තිබෙනවා. ඒකට කියනවා සැකය සාංඛාව දුරු කරන සැකය තරණය කරන්නා වූ ධර්ම ප්‍රතිපදාව, **කඞ්ඛාවිතරණ විසුද්ධිය** කියලා.

මේ සැක සංඛා නැතිවීම සඳහා මෙනෙහි කරන්න ධර්ම කොටසක් කියලා දෙනවා. අපි පහු ගිය දවස්වල දිගටම කථා කරගෙන ආව පටිච්චසමුප්පාදය ගැන. අපි පටිච්චසමුප්පාදය theoretically කථා කළේ. බුදුරජාණන්වහන්සේගේ දේශනාවේ පටිච්චසමුප්පාදය දේශනා කරලා තිබෙන විදියට කරුණු කාරණා අරගෙන අපි පටිච්චසමුප්පාදය දැන් බොහෝ වාර ගණනක් කථා කළා. ඒ පටිච්චසමුප්පාදය පිළිබඳව දැනුමක් තේරුමක් හොඳට තිබෙන්න ඕනෑ මේ පින්වතුන්ට. පටිච්චසමුප්පාදය කියන එක මහා ගාම්භීරයි. ඒ කියපු ටිකෙන් මේක සම්පූර්ණවෙනවා කියලා අපි විස්වාස කරන්නේ නෑ. තව ඕක අහන්න ඕනෑ, හිතන්න ඕනෑ, ප්‍රශ්න කරන්න ඕනෑ. මේ ධර්ම තව අහන්න හිතන්න ඕනෑ. එතකොට තමයි ධර්මයේ ගාම්භීරත්වය මතු වෙලා එන්නේ.

බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙන්නේ හේතු ඵල ධර්මයක්. හේතු ඵල දැන ගැනීම සඳහා හොඳට ධර්ම කාණ්ඩ කාණ්ඩ පුංචියට කොටස් කරලා දේශනා කළා. ඒකට කියනවා විභජනය කරනවා කියලා. ඒක නිසා කියනවා ඒකට විභජ්ජවාදය කියලා. දැන් මේ **කඞ්ඛාවිතරණය** ඇති කරගන්න සැක සංඛා දුරුකර ගන්න හොඳම වැඩක් තමයි මෙන්න මේ කියන බෙදා බැලීම හෙවත් **පටිච්චසමුප්පාදය** මෙනෙහි කිරීම. ඒකට කියනවා **ධම්මට්ඨිතිඤාණය** කියලා. ඒකට **යථාභූත ඤාණය** කියලත් කියනවා. **ඤාණදස්සනය** කියලත් කියනවා. **සම්මා දස්සනය** කියලත් කියනවා.

මේ ඥානය විපස්සනා භාවනා මනසිකාරයේ සම්මර්ශන අවස්ථාවේ තිබෙන්නා වූ දෙයක්. මේකෙන් නැති වෙන ධර්ම මොනවාද කියලා අපි බලමු. අපිට මෙන්න මේ වගේ සැක ඇතිවෙනවා.

1. **'අහොසිං නු ඛො අහං අතීතමද්ධානං?** = මම අතීතයේ හිටියද?
   'ඉස්සර කාලේ මම හිටියද? කොහෙද හිටියේ? කියලා . මේ සැකය ඇති වෙන්නේ කාල වශයෙන් අතීතය පැත්තට.

2. **න නු ඛො අහොසිං අතීතමද්ධානං?** = මම අතීතයේ හිටියේ නැත්ද?
   ඇත්තටම මම අතීතයේ හිටියා කියලා දැන් හිතුවට මම හිටියේ නැතුව ඇති කියලා සැකයක් ඇතිවෙනවා.

3. **කිං නු ඛො අහොසිං අතීතමද්ධානං?** = මම ඉස්සර හිටියානම් ඒ කවුරු හැටියටද?
   මම ඉස්සර හිටියා නම් දෙවියෙක්ද? තිරිසනෙක්ද? බ්‍රහ්මයෙක්ද? වෙන සත්වයෙක්ද? කියලා සැක ඇතිවෙනවා.

4. **කථං නු ඛො අහොසිං අතීතමද්ධානං?** = මම කවුරුහරි වෙලා හිටියේ කොහොමද?
   මම වතුරේ හිටියද? අහසේ හිටියද? ගහක හිටියද? හුඹහක හිටියද? කියලා සැක ඇතිවෙනවා)

5. **කිං හුත්වා කිං අහොසිං නු ඛො අහං අතීතමද්ධානං?** ඉස්සර මම කවුරු හැටියට ඉඳලා ඊට පස්සේ කවුරු උනාද?

ඉස්සර මම හිටියේ කොහොමද ඊට පස්සේ දැන් මොකක්ද උනේ කියලා සැක ඇතිවෙනවා. අපි හැම එක්කෙනාම හිතාගෙන ඉන්න විදියක් තිබෙනවා. ඒ තමයි 'මමනම් නරක තැනකින් ඇවිල්ලා නෑ' කියලා. අපි හිතාගෙන ඉන්නේ අපි දිව්‍යලෝකයෙන් හරි මනුස්සලෝකයෙන් හරි එන්න ඇත්තේ කියලා. අපි කවුරුවත් කියන්නේ නෑ තිරිසන් ලෝකයෙන් ආව අපායෙන් ආවා කියලා. නමුත් එහෙම වෙන්න පුළුවන්.

ඉහත සඳහන් 1 සිට 5 දක්වා ඇති මේ සැක ඇතිවෙන්නේ අතීතය සම්බන්ධයෙනුයි. මේ සම්බන්ධයෙන් කිසිකෙනෙකුට ස්ථිරව කියන්න බෑ. ඒක නිසා මේ ගැන සියලුදෙනාටම තිබෙන්නේ සැක. ඊළඟට තවත් තිබෙනවා අනාගතය පිළිබඳව සැක 5ක්.

1. **භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං?** = මම මැරිලා ගිහිල්ලා අනාගතයේ කවුරු හරි කෙනෙක් වෙනවද?

2. **න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං?** = මම මැරුණට පස්සේ අනාගතයේ නැවත කවුරුවත් වෙන්නේ නැත්ද?

3. **කිං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං?** = මම අනාගතයේදී වෙන්නේ කවුද?
   කව්රු හරි වෙනවා නම් දෙවි කෙනෙක් වෙනවද? බ්‍රහ්මයෙක් වෙනවද? මනුස්සයෙක් වෙනවද? තිරිසනෙක් වෙනවද? කියලා සැක ඇතිවෙනවා.

4. **කථං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං?** = එහෙම අනාගතයේදී කවුරුහරි වෙනවා නම් කොහොම කෙනෙක් වෙනවද? මොන ශරීර හැඩරුව ඇති කෙනෙක්ද? පියාසර කරන කෙනෙක්ද? ඇවිදගෙන යන කෙනෙක්ද? ජලයක ගොඩබිමක ඉන්නා වූ කෙනෙක්ද? කියලා සැක ඇතිවෙනවා.

5. **කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං?** = මම අනාගතයේ වෙනවා නම් කවුරුන් වෙලා ඉඳලා කවුරුන් වෙනවාද?

අනාගතය පිළිබඳවත් ඉහත සඳහන් අයුරින් සැක පහක් ඇතිවෙනවා. මේ විදියට සැක කරන විදි 10 එක්කෙනුකුට මේ දේශනාවේ තිබෙන ආකාරයටම ඇති වෙන්නේ නෑ. මේ සැක වලින් දෙක තුනක් එක්කෙනුකුට තිබෙනවා. සමහර වෙලාවට මෙයින් දෙක තුනක් පිළිබඳව වැඩියෙන් හිතනවා. මේ ස්වභාවය තමයි තිබෙන්නේ.

බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා කරනකොට ධර්මය දන්නා සුළු පිරිසකට පමණක් නොවෙයි දේශනා කරන්නේ. සාසනයේ ඉන්න, සාසනයට එන මුළු සත්ව සමූහයාම අලළා තමයි මේ ධර්මය දේශනා කරන්නේ. බ්‍රහමයෝ දෙවියෝ මනුස්සයෝ සියලු දෙනාම මේකට අන්තර්ගතයි. ඒ හැම කෙනාම පොදුවේ අතීතය සම්බන්ධයෙන් හිතන හැටි තමයි මෙතැන තිබෙන්නේ. අපි මේ කථා කරන්නේ සැක කිරීම පිළිබඳවයි. මේ සැකය සාමාන්‍යයෙන් අපි හිතන විදියේ, ගෙයක් තිබුණාද? නැත්ද? ලෙඩ හැදෙයිද? නැත්ද? මට කෑම ලැබෙයිද? නැත්ද? වගේ සැක නොවෙයි. ඒවා සාමාන්‍යයෙන් මිනිස්සු එදිනෙදා ජීවිතීයේදී හොයන කියන කථා කරන දේවල්. මේ සැක ඊට වඩා මහා ගාම්භීර එකක්. මේක මනුස්සයාගේ පැවැත්ම පිළිබඳව මනුස්සයාගේ ඇතිවීම පිළිබඳව ඇතිවෙන සැක.

තවත් සැකයක් තිබෙනවා වර්තමාන සම්බන්ධයෙන්. ඒ තමයි

1. **'අහං නු ඛොස්මි?** = ඇත්තට මම ඉන්නවද?
   මෙයා දැන් මේ වර්තමානයේ ජීවත් වෙමින් හිතනවා එයා ඇත්තටම ඉන්නවද කියලා.

2. **'නො නු ඛොස්මි**? = මම කියල කෙනෙක් නැත්ද?

3. **'කිං නු ඛොස්මි?** = දැන් මම ඉන්නවා නම් ඒ කවුද?

4. **'කථං නු ඛොස්මි?** = දැන් මම ඉන්නවා නම් මම පවතින්නේ කොහොමද?

දැන් අපි මේ ආශ්වාස ප්‍රාශ්වාස කරන පරිසරයත් එක්ක ගැවැසෙන නිසා අපිට ඒක වැඩිපුර දැනෙන්නේ නෑ. නමුත් එහෙම සැක කරන අය ඉන්නවා.

5. **අයං නු ඛො සත්තො කුතො ආගතො?** = මම කියන එක්කෙනා මෙතැනට ආවේ කොතැන ඉඳලාද?

මම කියන එක්කෙනා දැන් ඉන්නවා, නමුත් මෙතැනට පත් උනේ කොතැන ඉඳලාද? කියලා සැකයක් ඇතිවෙනවා.

6. **සො කුහිං ගාමී භවිස්සතී'ති?** = මේ ඉන්න කෙනා මෙතැනින් පස්සේ යන්නේ කොතැනටද?

වර්තමානයේ සත්වයා පිළිබඳව ඇතිවෙන සැක හයක් මේ. දැන් අතීත අනාගත වර්තමාන වශයෙන් සැක 16 ක් තිබෙනවා. මේක මහා සැක ගොඩක්. මේ සැක ටික ඔක්කොම පැකට් කරලා ගෝනි කරලා තියෙන්නේ අපේ හිතේ. මේ හිත නිවන් දකින්න සුදුසු නෑ, මේ සිත සැක වලින් පිරිලා. මේ සැක තියාගෙන භාවනා කරන්න බෑ. සිල් රකින්න බෑ.

අතීතයට බරව හෝ අනාගතයට බරව හෝ වර්තමානයට බරව සැක එකක් හෝ දෙකක් හෝ කාණ්ඩයක් හෝ තිබෙනවා නම් කිසිම දවසක ඒ කෙනාට මේ හිත නිදහස් කරගෙන නිවන් අවබෝධ කරගන්න, ධර්ම මාර්ගයේ යාගන්න පුළුවන් කමක් නෑ. ඒ විතරක් නොවෙයි සෝවාන් වීම පිළිබඳව අපිට යන්න තිබෙන ගමනක් තිබෙනවා. සද්ධාව වඩාගෙන, වීර්ය සතිය වඩාගෙන, සමාධිය ප්‍රඥාව වඩාගෙන අපිට යන්න තිබෙන දහම් ගමනක් තිබෙනවා, ඒ ගමන යා ගන්න බෑ, මේ සැක ගොඩ නිසා.

මෙන්න මේ සැකය, මේ සංඛාව, මේ විචිකිච්ඡාව නැති කරගන්න අවශ්‍යයි. අන්න ඒ සැකය නැති කරගන්නාවූ සැකය සුද්ධ කරන්නාවූ ක්‍රමයට කියනවා සංඛාව නැති කරන **කඞ්ඛාවිතරණ විසුද්ධිය** කියලා. සැකදුරු කරන වැඩසටහනින් දුරුවෙන සැක 16 ක් තිබෙනවා. මෙන්න මේ සැක දුරු කිරීම සඳහා තමයි නාම රූප ධර්ම පිළිබඳව, පටිච්චසමුප්පාදය පිළිබඳව මෙනෙහි කරන්නේ. පටිච්චසමුප්පාදය ගැන ඉගෙන ගන්න ඕනෑ වෙන්නේ සැක දුරු කරගන්න, මේ සැක වලින් එතෙර වෙන්න. නාම රූප ධර්ම - පටිච්චසමුප්පාදය මෙනෙහි කළ යුතු වන්නේ - හේතුව ඵලය සැලකිය යුතු වන්නේ මේ සැකය නැති කරගන්නයි. ඒක නිසා මේ පටිච්චසමුප්පාදය ඉගෙන ගැනීම පටිච්චසමුප්පාදය ගැන දැන ගැනීම අපිට අතිශයෙන්ම ප්‍රයෝජනයි.

වෛද්‍යවරයෙක් ගාවට ලෙඩෙක් යනවා. ගිහිල්ලා ලෙඩ ගොඩක් කියනවා, 'ඔළුව කකියනවා, බෙල්ල කකියනවා, වමනේ යන්න එනවා, කෑම කන්න බෑ, ඇඟ සුදුමැලි වෙලා, ඇස් කහපාට වෙලා' කියලා ඔහොම ලෙඩ ගොඩක් කියනවා. දැන් මේ ඔක්කොම අහගෙන ඉන්නේ දොස්තර මහත්මයා. දොස්තර මහත්තයා මේ ලෙඩ ටික ඔක්කෝම අහගෙන ඉඳලා අහනවා 'කවදා ඉඳලද?' කියලා. එතකොට එයා කාලය කියනවා. ඒ ලෙඩාගේ ප්‍රශ්නය තිබෙන්නේ වර්තමානයේ උනාට දොස්තර මහත්මයා අහන්නේ අතීතය ගැන. ඇයි එහෙම අහන්නේ? එහෙම අහන්නේ ඒ ලෙඩේට 'හේතු' හොයාගන්න. දැන් හැදිලා තිබෙන උණට, ඇස් කහපාට වීමට අතීත හේතුවක්, අතීත සම්බන්ධයක් තිබෙනවා. වෛද්‍යවරයා ඒ දින වකවානු අහන්නේ ලෙඩේ තිබෙන්නා වූ මූලය, නිධානය, හේතුව ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගන්න. ආන්න ඒ වගේ දැනට තිබෙන **නාම රූප** ධර්මයෝ මෙතැනට ආවේ කොහොමද කියලා බලන්න නම් අපි අතීතය පැත්තට ගිහිල්ලා බලන්න ඕනෑ.

අනිත් එක තමයි, මනුස්සයෙක් පාරේ යනවා. එතකොට ඒ පාරේ අයිනේ දරුවෙක් දාලා ඉන්නවා. ඒ දරුවා උඩුකුරුව ඉන්නවා. ඒ කරුණාවන්ත මනුස්සයා ඒ දරුවා දැකලා ළඟට යනවා. ගිහිල්ලා ඉස්සෙල්ලාම බලන්නේ ඒ දරුවා එතැනට ආවේ කොහොමද, ඒ දරුවා එතැනට ගෙනැල්ල දැම්මේ කවුද, අම්මා කවුද තාත්තා කවුද කියලා. ඒ දරුවා එතැනට එන්න හේතු උනේ කවුද කියන එක හොයනවා, දරුවා අතහැරලා යන්නේ නෑ. ඇයි අම්මයි තාත්තයි හොයන්නේ? ඒ දරුවා බාර දෙන්න. ආන්න ඒ වගේ, ලෙඩක් දැක්කහම ඒ ලෙඩේ තිබෙන්නා වූ නිධානය දක්ෂ වෛද්‍යවරයෙක් හොයා ගන්නවා වගේ, පුංචි දරුවෙක් දැක්කහම ඒ දරුවාගේ දෙමව්පියෝ කවුද කියලා හොයන්න වගේ ඥානවන්ත සත්පුරුෂයා මේ ජීවිතය දැක්කට පස්සේ මේ ජීවිතය මෙතැනට ආවේ කොහෙන්ද?

මේ ජීවිතියේ අයිති කාරයෝ කවුද? මේ ජීවිතිය මෙතැනට ඉස්සෙල්ලා කොතැනද තිබුණේ කියලා මේකේ තිබෙන්නා වූ හේතු කාරණා ටික හොයාගෙන හොයාගෙන යන්න ඕනෑ.

ඒක නිසා තමයි බුදුරජාණන්වහන්සේ මේ ජීවිතියේ නාම රූප ධර්මයන්ගේ ඇදියාව, නාම රූප ධර්මයන්ගේ පරණ ඒවත් එක්ක තිබෙන සහසම්බන්ධතාවය හොයන්න හේතු ඵල සැලකීම දේශනා කරන්නේ. මේ නාම රූපයන්ගේ හේතු ඵල හොයන්නේ අතීතයෙන් නොවෙයි, වර්තමානයේ ඉඳලා. මේක හොඳට මතක තබා ගන්න.

දැන් ලෙඩෙක් ගිහිල්ලා වෛද්‍යවරයාට ලෙඩේ විස්තර කියපු ගමන්ම ලෙඩාගෙන් address එක අහගන ලෙඩාගෙ ගෙදර දුවලා එහෙ පරිසරය බලන එක නොවෙයි කරන්න තිබෙන්නේ. වෛද්‍යවරයා ළඟට ලෙඩා ගියාට පස්සේ ඒ තොරතුරු විස්තරයෙන් ඥානවන්තව එකින් එකට, එකින් එකට ගලපා ගලපා පිටි පස්සට යැමයි කළ යුතු වන්නේ.

ඒ වගේම දරුවෙක් දැක්කට පස්සේ කවුරුහරි කාන්තාවක් හොයාගෙන පුරුෂයෙක් හොයාගෙන ඔයාගේ නෑදෑයා කවුද? ඔයාගේ පුතා කවුද? කියලා හොයගගෙන හොයාගෙන ගිහිල්ලා මේ දරුවා ගාවට එන එක නොවෙයි කරන්න තිබෙන්නේ, දරුවා ගාවෙන් පටන්ගෙන ආපහු යන්න ඕනෑ පිටි පස්සට.

මේ කියන්නේ, වර්තමානයේ යම් කිසි දෙයක් තිබෙනවාද, වර්තමානයේ යම්කිසි දෙයක් හමු උනාද ඒ වර්තමානයේ දෙයින් තමයි අපි අනිත් පැත්තට සහසම්බන්ධය හොයාගෙන යන්නේ. ඒකයි මේකේ තේරුම. අපි එකපාරටම හොයාගෙන වර්තමානයට එන එක නොවෙයි තිබෙන්නේ, වර්තමානයේ දෙයක් තිබෙනවා නම් ඒ දෙයින් යන්න ඕනෑ වෙන්නේ අතීතයට.

මේක ටිකක් ගාම්භීරයි. මේක ධම්ම සම්මර්ශනය කිරීම සඳහා අවශ්‍ය වෙන ඉතාමත්ම වටිනා, ඉතාමත්ම වැදගත් කරුණු ටිකක්. හේතු ප්‍රත්‍යය ධර්ම සලකන, පටිච්චසමුප්පාදය සලකා ගන්න, පටිච්චසමුප්පාදයේ තිබෙන ගාම්භීර හේතුඵල ධර්ම වල සහ සම්බන්ධය හොයා ගන්න විදියක් මේ.

අපි හිතන්න ඕනෑ, මම කවුද? ඇයි මම? මට ඇයි මෙහෙම උනේ? මොකක් නිසාද? කියලා. එහෙම අහන ප්‍රශ්න අඩුයි. ඇයි අපිට මෙහෙම උනේ කියන ප්‍රශ්නය අහන්නේ නෑ. නමුත් දැනට තිබෙන තත්වය, දැනට ඉන්නකෙනා වෙනත් කෙනෙක් කරන්න මහන්සි ගන්න එක කරනවා. වෙනත් කෙනෙක් බවට පත් කරන්න, කෙටි කාලීනව සහ දීර්ඝ කාලීනව plan හදනවා ඇරෙන්න මේකට මෙහෙම උනේ ඇයි කියලා ප්‍රශ්නේ අහන්නේ නෑ, බොහෝ අය.

මේකට හේතුව මේකයි. දැන් මේ ඉන්න ඔක්කොගේම මුණු එක විදියද? හමේ පාට එකවිදියද? නෑ, කටහඬ එකවිදියද? නෑ. අපි මේවා ගැන ප්‍රශ්න කරන්නේ නෑ. ඇයි මම මෙච්චර උස, ඇයි මම මෙච්චර මිටි කියලා ප්‍රශ්න කරන්නේ නෑ. එහෙම කරනවා නම් අපිට හිතෙනවා ඒකට හේතුව හොයාගෙන යන්න. එහෙම ප්‍රශ්න කිරීමකින් තොරව අපි කරන්නේ ඒ ප්‍රශ්නයට ක්ෂණික සහ දීර්ඝ කාලීනව උත්තර හොයනවා. මිටියි නම් අඩි උස සපත්තු දානවා. කෙට්ටුයි වගෙයි නම් මහතට පේන්න ඇඳුම් අඳිනවා. ඇයි කොන්ඩේ සුදු වෙන්නේ? ඒ ප්‍රශ්නය තමන්ගෙන් අහන්නේ නැතුව කොන්ඩේ කළු කරනවා. ඒකෙන් අයින් වෙලා වෙන කෙනෙක් වෙනවා. ඒ වගේ ඇස් වලට, දත් වලට, හමේ පාටට මෙහෙම උනේ කියලා අහන්නේ නැතුව වෙන විදියකට ගිහිල්ලා ඒවා හදාගන්නවා. මේක නිසා අපිට ධර්මය තේරෙන්නේ නෑ. මේක නිසා පටිච්චසමුප්පාදය හැංගිලා යනවා.

ඒක නිසා අපිට කරන්න තිබෙන්නේ වර්තමානයේ ඇයි මට මෙහෙම උනේ ඇයි? ඇයි මම මෙච්චර උස? ඇයි මම මෙච්චර මිටි? ඇයි මම මෙච්චර මහත? කියලා විස්තර වශයෙන් අහනවා වගේම ඇයි මට මේ හිතක්? ඇයි මට මේ සැක? ඇයි මට ඉගෙන ගන්න බැරි? කියලා අහන්න ඕනෑ. ඒවා අහනකොට අපිට ඇතිවෙනවා මේ අපේ විවිධත්වයට හේතුව. ඇත්ත වශයෙන්ම මේ හැමෝගෙම ජීවිත දිහා බැලුවම අපි පොදුවේ පිළිගත්ත සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ රෙජිස්ටර් වෙච්ච බෙහෙත් වලට අදාළ රෝග නැති උනාට අපි නිරෝගී නෑ. අපි ඇත්ත වශයෙන්ම නිරෝගී නෑ. හේතුව, අපිට ලෙඩ ගොඩක් තිබෙනවා. උස ගැන ප්‍රශ්න, මිටි ගැන ප්‍රශ්න, පාට ගැන ප්‍රශ්න, දත් ගැන ප්‍රශ්න, ඇස් ගැන ප්‍රශ්න. මේවා ඔක්කෝම ලෙඩ. ඇයි මට මේ ඇහුවට ඇහුවට මතක හිටින්නේ නැත්තේ? ඒකත් ලෙඩක්. අනිත් එක සමහරු කථා කරනවා කථා කරනවා ඒකත් ලෙඩක්. සමහරු කථා කරන්නේ නෑ. ඇයි එහෙම වෙන්නේ කියලා හිතාගෙන ගියාට පස්සේ ලොකු පොඩි වශයෙන් ලෙඩ ගොඩක් තිබෙනවා.

දැන් මෙන්න මේ කියන්නාවූ කරුණු ටික වර්තමානය දිහා බලලා, වර්තමානයේ තිබෙන ටික දැනගෙන දැකගෙන පිටි පස්සට පිටි පස්සට යන්න ඕනෑ. 'මම මේ දැන් ඉන්න තත්වයට හේතු උනේ මොකක්ද?' කියලා ආපස්සට ගිහිල්ලා බලන්න ඕනෑ. ඒ බලන ක්‍රම කීපයක් තිබෙනවා.

දැන් අපි මේ භවයට ආවේ පෙර භවයේ ඉඳලා කියලත් කියනවා. නමුත් පෙර භවය කියන එක ධර්මය ඇසීම තුලින් කියනවා මිසක අපිට හරියටම ඒ ගැන විස්වාස නෑ. අපි ඉස්සරවෙලාම අපු තැන මතකයි. ඒ තමයි මවුකුස. මවුකුසේ උපදින්නා වූ දරුවාට **හේතු** වෙන්නා වූ ධර්ම **පහක්** තිබෙනවා. මේක හොඳට තේරුම් ගන්න. අපි මවුකුසේ උපදින දරුවා කියලා බාර ගන්නේ කලලයක්. ඒ කලලය රූපයක්. අපි වැඩි වටිනාකමක් දීලා කථා කරන්නේ ඒ රූපය ගැන. ඒ දරුවාගේ හිත ගැන කථා කරන්නේ නෑ. එතකොට අපි දරුවා කියලා බාර ගන්නේ පුංචි මස් කුට්ටියක්. ඒ මවුකුසේ ඉන්න දරුවාට රූපමය පරිසරය තිබෙන්නේ මවුගේ ශරීරයේ. මේ පටිච්චසමුප්පාද කථාවේ පටිච්චසමුප්පාදයට අනුව ධර්මය හොයාගෙන යැමේදී මෙයිට වඩා දෙයක් සොයාගෙන යන්න ඕනෑ. ඒ තමයි මවු කුසක උපදින දරුවාට හේතුවෙන ධර්ම 5 තිබෙනවා. ධර්මානුකූලව ඒ දරුවා එතැන උපදිනවා කියලා කියන්නේ කලලයක් හටගැනීම නොවෙයි, සිතක හට ගැනීමයි.

වෛද්‍ය ශාස්ත්‍රානුකූලව දරුවෙක් හටගත්තාද කියලා බලන්නේ scan එකක් කරලා. එතකොට fetus එකක් පේන්න තිබෙනවා. නමුත් ධර්මනුකූල ඇසෙන් බලන්නනේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් තිබෙනවද කියලයි. එතකොට පළවෙනි එක ප්‍රතිසන්ධි විඤ්ඤාණයයි. ඒක රූපයක් නොවෙයි. ඒක හිතක්. ආන්න ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය ගුලි කරගෙන, ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය කොටු කරගෙන ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණය කේන්ද්‍ර කරගෙන තමයි අර පුංචි කලලය හැදෙන්නේ. එතකොට පුංචි දරුවා කියලා කියන්නේ කලලය විතරක් නොවෙයි. විඤ්ඤාණය බද්ධ වෙච්ච කලලයට තමයි කියන්නේ දරුවා කියලා. මෙන්න මේ කියන්නාවූ විඤ්ඤාණයටයි කලල රූපයටයි හටගන්න හේතු වෙච්ච කාරණා 5 ක් තිබෙනවා.

ඒ ධර්ම කාරණා 5 scan කරාට පේන්නේ නෑ. ඒක නිසා ධර්ම ඇසෙන් බලන්න ඕනෑ. ධර්ම ඇසෙන් බලනකොට තිබෙන කාරණා පහ තමයි,

1. **අවිද්‍යාව**
2. **තණ්හාව**
3. **උපාදානය**
4. **කර්මය**
5. **ආහාර**

ඒක අපි මෙහෙම තේරුම් ගනිමු. දැන් මේ පින්වතුන් ලංකාවේ ඉන්නේ නැතුව නවසීලන්තයට ආවා. ඒ ආවේ මෙහෙට ආස කරපු හින්දයි. ඒවගේ තමයි සත්වයෙක්, යම්කිසි හිතක් මවුකුසකට යන්නෙත් එතැනට ආස කරන නිසයි. අපි මෙහෙන් යන්නේ නැත්තේ මෙහෙ හොඳයි කියලා තදින් බාර අරගෙන තිබෙන නිසා. ඒක තමයි උපාදනය කියලා කියන්නේ. අපි ආස කරලා මෙහෙට ආවා. ඒක අතහරින්නේ නෑ. ඒ අපිට මෙහෙ උපාදානය වෙලා. ඒවගේ තමයි යම්කිසි හිතක් මව් කුසකට ආස කරනවා වගේම තද බල උපාදානයකුත් තිබෙනවා. අපි මේක ලංකාවට සාපේක්ෂව දිව්‍යලෝකය වගේ හිතාගත්තට සම්පූර්ණයෙන්ම එහෙම නොවෙයි. මෙහෙ ඉන්න මිනිස්සුත් ලෙඩ වෙනවා, සෝක කරනවා, අඬනවා, මැරෙනවා. සමාන කම් අසමාන කම් ගොඩක් තිබෙනවා. ලංකාවේ කවුරු හරි කෙනෙක් ඇඬුවොත් ඒ කෙනාට වතුර ටිකක් දෙන්න ඒ දුක කියන්න අස්වසන්න අයියා කෙනෙක් අක්කා කෙනෙක් නැන්ද කෙනෙක් මාමා කෙනෙක් අසල් වැසියෝ ඉන්නවා. එතකොට එයාගේ ඒ ඇඬීමට එක්තරා විදියකට සහනයක් වෙනවා. මේ රටෙත් එහෙම අය ඉන්නවා නමුත් ඒ අයට ගෙවන්න ඕනෑ. ඒ අයගෙන් අඬන්න එපා කියලා උපදෙසක් ගන්න අඬ අඬා එතැනට යන්න වෙනවා. ගිහිල්ලා එයා කියන ටික අහලා සල්ලි ගෙවලා එන්න ඕනෑ. එහෙම තමයි මෙහෙ තිබෙන ක්‍රමය. අඬන එකට සහනයක් ලබා ගන්න ලංකාවේ ඔක්කොම දේවල් නොමිලේ. ඒවගේ වෙනසක් මෙහි තිබෙනවා. අපි මෙහෙට ආවේ ආලයෙන් තණ්හාවෙන්, ඉන්නේ බැඳීමෙන් උපාදානයෙන්. මේකේ තිබෙන යම්යම් දුක් කරදර අපිට තේරුණේ නෑ. ඒක නිසා ඒකට කියනවා **අවිද්‍යාව** කියලා. ඒක නිසා මෙහෙට එන්නත් තිබෙනවා එක්තරා විදියක **අවිද්‍යාවක් - තණ්හාවක් - උපාදානයක් - කර්මයක්**. මෙහෙ නිකන් පවතින්න බෑ, **ආහාරත්** අවශ්‍යයයි. මේ කරුණු 5 වගේම තමයි මවු කුසක උපන්නාවූ දරුවා එතැනට පැමිණ තිබෙන්නේ **අවිද්‍යාව තණ්හාව උපාදානය** සහ **කර්මය** නිසා පවතින්නේ **ආහාර** නිසා. මේ ධර්ම කරුණු 5 තමයි ඒ මනුස්ස හිතක් හැටියට මවුකුසක ඉපදිලා ඉන්න දරුවෙකුට ප්‍රධාන හේතු.

මේ කියන කරුණු කරණා 5 අපි දෙකට කඩන්න ඕනෑ. ඒ තමයි පළවෙනි කරුණු 4

අවිද්‍යා
තණ්හාව
උපාදාන
කර්ම

} මේ කරුණු 4 ට කියනවා **නිබ්බත්තක හේතු (උප්පත්ති හේතු)** කියලා. මේ දරුවාට මවුකුසේ ඉපදෙන්න ඒකාන්තයෙන්ම හේතු උනේ මේ කරුණු 4යි.

ආහාරය } **උපස්තම්භක** (මවු කුසට ආපු කෙනා මෙහෙ ඇවිල්ලා පැවතීමට කෑම කනවා. ඒකට කියනවා උපස්තම්භක හේතුව කියලා.

උපදින්න හේතු උනේ **අවිද්‍යාව තණ්හාව උපාදාන** සහ **කර්ම**. අපි වගේ තමයි. ලංකාවේ ඉඳලා නොදන්නා කමින් තණ්හාවෙන් ඇවිල්ලා උපාදානය කරලා මෙහෙට එන්න ඉගෙන ගැනීම් ආදී කර්ම සකස් කරලා මෙහෙට ආවා. දැන් මෙහෙට ඇවිල්ලා කන්නේ නැතුව ඉන්න බෑ. මෙහෙ ඇවිල්ල පවතින්න අවශ්‍ය දේ තමයි **ආහාර පාන**. එය **උප්සම්භක** හේතුවයි. මනුස්ස ලෝකයට එන්නා වූ සත්වයාට **අවිද්‍යා තණ්හා උපාදාන කර්ම** කියන හතරම මෙහෙට එන්න හේතු. එයා ඇවිල්ලා ඉන්නේ **ආහාර** හේතුවෙන්. ඒකට කියනවා **උපස්තම්භක** හේතුව කියනවා.

මේ **අවිද්‍යා - තණ්හා - උපාදන** කියන කරුණු තුන හරියට අම්මා වගේ. හැම වෙලේම අම්මගේ වැඩේ තමයි ළමයි ළං කර ගන්න එක, අල්ලා ගන්න එක, තුරුල් කරගන්න එක. නියම ගෙදරක් අරන් බලන්න, අම්මා තමයි ළමයි හුරතල් කර කර වඩාගෙන ළංකරගෙන ඉන්නේ. තාත්තා තමයි ගිහිල්ලා

රස්සාව කරලා මුදල් උපයාගෙන කියාගෙන එන්නේ. තාත්තා තමයි හම්බ කරන්නේ. ඔයවගේ තමයි **අවිද්‍යාවයි තණ්හාවයි උපාදනයයි** උපමාවක් හැටියට මාත්‍ර ගුණික ධර්ම හැටියට සලකනවා. **කර්ම රැස් කිරීම** තාත්තට උපමා කරනවා. ඒක නිසා යම්කිසි කෙනෙකුගේ ජීවිතියේ උපයන කෙනා, හොයන කෙනා, කර්ම රැස් කරන කෙනා තමයි කර්මය. එතකොට එක පවුලක්, ගෙදරක් ගත්තොත් එහෙම ඔය විදියටයි තිබෙන්නේ. **තණ්හා - උපාදන -අවිද්‍යා** අම්මා වගෙයි. **කර්මය** සකස් කිරීම හරියට පියා වගෙයි. තත්තා හම්බකරගෙන ආවහම ගෙදර ඉන්නවා උයන අම්මා කෙනෙක්, එයාගේ වැඩේ උය උයා මේසෙන් තියන එක. ඒ ආයම්මගේ වැඩේ වගේ තමයි මේ **උපස්තම්භනය කරන්නා වූ ආහාරය.** අම්මා තත්තා ළමයි ඒ සියලු දෙනාටම කෑම දෙන්නේ, ඒ අයට පැවැත්ම හදලා දෙන්නේ, උපස්තම්භනය කරන්නේ ගෙදර ඉන්නාවූ ආහාර පිසින කෙනා. මේ කියන්නාවූ ධර්ම 5හේ හැඩ තල එක එක විදියට බලපු විදියයි මේ.

අපි පහුගිය කාලේ කථා කළා අවිද්‍යාව කොහොමද සංස්කාරයන්ට හේතු උනේ - සංස්කාර කොහොමද විඤ්ඤාණයට හේතු උනේ - විඤ්ඤාණය කොහොමද නාම රූප වලට හේතු උනේ - නාම රූප කොහොමද සළායතන වලට හේතු උනේ - සළායතන කොහොමද ඵස්සයට හේතු උනේ - ඵස්සය කොහොමද වේදනාවට හේතු උනේ - වේදනාව කොහොමද තණ්හාවට හේතු උනේ - තණ්හාව කොහොමද උපාදානයට හේතු උනේ - උපාදානය කොහොමද භවයට හේතු උනේ - භවය කොහොමද ජාතියට උදව් උනේ - ජාතිය කොහොමද ජරාමරණයට හේතු උනේ කියලා හොයන්න කියලා දෙන එක තමයි ඉස්සෙල්ලා කළේ.

අද මේ කිව්වේ, සත්වයෙක් වර්තමානයේ ඉඳලා අතීතයට දෙසට බලාගෙන යනකොට මවුකුසේ හට ගත්තා වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණය සහිත කලල රූපයට විශේෂ වශයෙන් හේතු වෙන ප්‍රධාන කරුණු 5 ක් තිබෙනවා. ඒ තමයි **අවිද්‍යා - තණ්හා - උපාදාන - කර්ම - ආහාර**. මේ හේතු හතරින් එකක් **උපස්තම්භකයි** අනිත් ඒවා **නිබ්බත්ති** ලක්ෂණ ස්වභාවයෙන් යුක්තයි.

අපි මේක මේ විදියට බලන්නේ, මේ විදියට මෙනෙහි කරන්නේ කුමක් සඳහාද? අපේ සැකය සංඛාව දුරුකර ගන්න. කඞ්ඛාව තරණය කරගන්න. කඞ්ඛාවිතරණ විසුද්ධියට හේතු වෙන්නේ විශේෂයෙන්ම පටිච්චසමුප්පාදය පිළිබඳව මෙනෙහි කිරීම, සැලකීම.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පටිච්චසමුප්පාදය කියන කොට භවය ගැන කියවුනේ නෑ නේද?

<u>පිළිතුර</u> - මේකේ **භවය** කියවුනා. භව කියන වචනයෙන් නෙමෙයි ඒක කියවුනේ, **කර්ම** කියන වචනයෙන් ඒක කියවුනේ. සමහර වෙලාවට **චේතනාව** කියන වචනය තිබෙනවා, සමහර වෙලාවට **භව** කියන වචනය තිබෙනවා.

යම්කිසි තැනක ඇඟක් තිබුණොත් ශරීරයක් හැදුනොත් ඒ ශරීරය හින්දා ප්‍රශ්න ඇතිවෙනවා ගොඩක්. අපිට උගන්වනවා critical thinking කියලා දෙයක්. අනිත් එක creative thinking. මම මේ කාරණය මේ පින්වතුන්ට දුන්නේ freeze වෙලා තිබෙන හිත, හිතන්නේ නැතුව පාළුවෙලා නිකම්ම නිකම් කඩා වැටී තිබෙන්නාවූ සිතට සිතන pattern කාවද්දන. මම හිතන විදිය මට පිහිට උනාට මේ පින්වතුන්ට ඒකෙන් යන්න බෑ. මම කිව්වා ශරීරයක් යම්කිසි තැනක ඇති උනාද ඒකෙ ප්‍රශ්න ගොඩක් ඇතිවෙනවා කියලා. ඒක දිරා යනවා, ලෙඩ වෙනවා, ආපදා ඇතිවෙනවා, මේවා ඔක්කොම පොදු දේවල්. මේක තව පොඩියට කඩන්න ඕනැ. මේ ශරීරයක් හැදුනට පස්සේ ඒකට සීතල දැනෙනවා, ඇසෙන් අඬන්න සිද්ධ වෙනවා, මහන්සිය ඇතිවෙනවා, පිපාසය දැනෙනවා, ඇනුම් යනවා, නිදිමත හැදෙනවා. මේ සියල්ලම සිදු වෙන්නේ මේ ශරීරය තිබුණ නිසා. කන්න ඕනැ, බොන්න ඕනැ, පිරිසිදු

කරන්න ඕනෑ, විවේකය දෙන්න ඕනෑ, මූණ අතපය හෝදන්න ඕනෑ, කොන්ඩේ පීරන්න ඕනෑ, අන්දවන්න ඕනෑ, එක තැන ඉන්නත් ඕනෑ, ඇවිද්දවන්නත් ඕනෑ. දීර්ඝ කාලීනව එක තැන ඉන්නත් බෑ, දීර්ඝ කාලීනව ඇවිදින්නත් බෑ, එකතැන් වෙන්න ඕනෑ. හිටගෙන ගොඩක් වෙලා ඉන්න බෑ ඒකනිසා වාඩි කරවන්න ඕනෑ. මේ ප්‍රශ්න ටික ඔක්කොම ශරීරයට සම්බන්ධයි. මේ ශරීරයට අවශ්‍ය ආහාර පාන ලබාදීම සඳහා අව්වේ හරි පින්නේ හරි තමයි වැඩ කරන්න ඕනෑ. ඒ වැඩ කිරීම මට නිදහසේ කරන්න බෑ. කවුරු හරි යටතේ වැඩ කරන්න ඕනෑ. මේ හැම එකක්ම පීඩාවල්. අනිත් එක තමයි අපි මේ ශරීරය අනිත් ශරීර වලට සමාන කරලා බලනවා. එතකොට අසමාන වෙච්ච තැන දුක හැදෙනවා. අනිත් එක තමයි කන විදීය අඳින විදිය වෙනස් කරනවා. මේ ශරීරයක් ලැබිච්ච හින්දා තමයි අඳින්න උනේ. ශරීරයක් ලැබිච්ච නිසා තමයි pattern එකක් දාන්න උනේ. මේ රූපය ආපු නිසා මේ වගේ වැඩ ගොඩක් තිබෙනවා නමුත් අපි ඒක හිතන්නේ නෑ. අපි ඒ ගැන හිතන්නනේ නැති නිසා ඒකෙන් හිතට තිබෙන පීඩාකාරී ස්වභාවය අපිට දැනෙන්නේ නෑ. දැන් භාවනා කිරීමට මේ ශරීරය හැසිරවීම සඳහා තමයි මහන්සි වෙලා කොට්ට හැදුවේ. ඒ කියන්නේ ශරීරයට විතරක් නොවෙයි, ශරීරය ඉන්දවන්න බඩු හොයන්න ඕනෑ. නිදි කරවන්න බඩු හොයන්න ඕනෑ. කවන්න පිඟානක් තිබෙන්න ඕනෑ. හැන්දක් තිබෙන්න ඕනෑ. ගැරුප්පුවක් තිබෙන්න ඕනෑ. ඊළඟට වතුර පොවන්න කෝප්ප තිබෙන්න ඕනෑ. ඒ කෝප්ප තියන්න තව තැනක් තිබෙන්න ඕනෑ. උණුසුම තිබෙන්න ඕනෑ. සිසිලස තිබෙන්න ඕනෑ. ඇඳ පුටු මේස අල්මාරි ආදී සියලුම බාහිරෙන් තිබෙන දේවල් අපිට හොයන්න උනේ මේ ශරීරය පදනම් කරගෙන. මේ විදියට ළඟ දුර වශයෙන් ගොඩක් කරුණු සම්බන්ධ වෙලා තිබෙනවා. යම්කිසි විදියකින් මේ ශරීරය නැති උනානම් පිඟන් කෝප්ප මේස පුටු ගෙවල් දොරවල් වලින් ආදී මේ කිසි දේකින් වැඩක් නෑ. ඒක නිසා මේ බාහිර දේවල් ජීවිතිය පදනම් වෙලයි තිබෙන්නේ. මේ දුක්ගොඩ ළඟ වශයෙන් දුර වශයෙන් සම්බන්ධ වෙලා තිබෙන්නේ.

මනුස්සයෙක් කේද්‍රය වෙලා ඒ මනුස්සයාගේ ජීවිතියට සම්බන්ධ ඉඩම් කඩම් තිබෙනවානම් ව්‍යාපාර තිබෙනවා නම් සම්බන්ධ දූ දරුවෝ ඉන්නවානම් ගෙයක් දොරක් තිබෙනවා නම් ඒ සියල්ලම මේ මනුස්සයට කේන්ද්‍රියයි. ළඟ දුර වශයෙන් තිබෙන සියලුම ප්‍රශ්න සම්බන්ධ වෙලා තිබෙන්නේ මෙයාගේ සිතටයි. ඒක නිසා බාහිර වශයෙන් තිබෙන්නා වූ ඉඩම් කඩම් දරු මල්ලෝ හැම එකක්ම මේ මනුස්ස ජීවිතියට දුක් උපදවන, පිඩාවල් හදලා දෙන දේවල්. ඇත්ත වශයෙන්ම පස්සේ බලාගෙන ගියහම අපි හිතමු අවුරුදු 90 ජීවත් වෙන මනුස්සයා අවුරුදු 89 ක් එළියේ ඉඳලා ඊට පස්සේ අවුරුද්දක් දානවා ඉස්පිරිතාලෙට. තව අවුරුද්දකින් මේ මනුස්සයා මැරෙනවා. ඒ අවුරුදු 89 ඒ මනුස්සයා හම්බකරා, ඉගෙනගත්තා. මේ ජීවිතිය සම්බන්ධයෙන් විශාල වගකීම් සමුදායක් කරදර සමුදායක් විඳලා විඳලා හම්බ කරලා එකතු කරලා ගෙවලා ඔක්කෝම කරලා අවසන් වෙලා දැන් තව අවුරුදකින් මැරෙනවා. මේ අවුරුදු 89 එයා කරදර වින්දට එයාට අයිති ඇඳන් පුටු කිසිම දෙයක් මෙයා ගෙනියන්නේ නෑ. අවිද්‍යාවෙන් පිරිච්ච ලෝකයක කිසිම දෙයක් දැන හඳුනා ගන්න බැරුව කොටුවෙලා හිටපු විදිය බලන්න. අපි හැම එක්කෙනාටම මේ ශරීරය නැති කල ඒ දුක් ටික ඔක්කෝම නෑ. ශරීරයක් ඇතිවෙන්නේ හිත නිසයි. හිතක් නැති කල ශරීරයක් නෑ, ශරීරයක් නැති කල ඒකට සම්බන්ධ දුක් මොකක්වත් නෑ. මෙන්න මේ විදියට බැලුවහම වෙනස් වීම, දිරා යෑම, ලෙඩ වීම වගේ ඒවා පොදු ඒවා. ඒකෙන් බැහැරට ගිහිල්ලා බැලුවට පස්සේ ටිකක් විශ්ලේශනය කරලා පොඩි පොඩියට කොටස් කරලා බැලුවට පස්සේ අපිට තේරෙනවා මේකේ තිබෙන්නාවූ දුක්ගොඩ.

අනිත් එක තමයි, දරුවෝ - ළමා ලපටි - ස්වාමියා - භාර්යාව - නෑදෑයෝ අපි ජීවිතියට ලංකර ගන්නේ එක අදහසකින්. ඒ ඔක්කොම අදහස් positive. නමුත් ඒවා ඔක්කොම එහෙමම නොවෙයි. ඒවා අපි හිතපු හැටියට වෙන්නේ නෑ. ඒ දූ දරුවන්ගේ ස්වාමියාගේ භාර්යාවගේ සිත් නෑදෑයන්ගේ සිත් වෙනස් වීමට යටත් කරලා හදලා දීපු හිත් නිසා ඒ ගොල්ලන්ගේ සිත් අපි සම්බන්ධයෙන් වෙනස් වෙනවා. අපි නිත්‍යය නොවෙන දෙයක්, ස්ථිර නොවෙන දෙයක් අල්ලාගෙන ඒකට නිත්‍යත්වයක් කවන්න උත්සාහ කිරීමේ මෝඩ වැඩේ උදේ ඉඳලා හැන්දෑ වෙනකම් කරගෙන යනවා. ඔය පටලැවිල්ල තමයි අපිට

තිබෙන්නේ. අපි තේරුම් ගන්නේ නෑ මේවා නිත්‍ය නෑ, ස්ථිර නෑ කියලා. අපි හිතනවා ඒ අයගේ පොඩි පොඩි අඩුපාඩු තිබුණත් පස්සේ ඒවා මග හැරෙයි කියලා. ඒක නිසාම අපි මහා විසාල දුකක ඉන්නවා. අපි හැම එක්කෙනාම ලොකු පොඩි වශයෙන් මේ ටික තමයි කරගෙන යන්නේ. ඒකට අපි positive thinking කියලත් වචනයක් පාවිච්චි කරනවා. ඇත්තටම මට ඒකට කියන්න තිබෙන්නේ positive thinking – realistically suffering කියලයි. ඔහොම තමයි ඕක තිබෙන්නේ. තව කාරණයක් තිබෙනවා කියලා දෙන්න .... (මේ දේශනාව මෙතැනින් අවසානයි)

සාධු! සාධු! සාධු!

ඉහත සඳහන් ධර්ම දේශනාවඅති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.